# <u>තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව</u>

රාහුල් සමන්ත හෙට්ටිආරච්චි
405/1 පන්සල පාර,
වඳුරුප්ප,
අම්බලන්තොට

**<u>අභියාචක</u>**

**අභියාචනා අංකය :**
**722/2021**

**එදිරිව**

දේශීය අදායම්
දෙපාර්තමේන්තුව
ශ්‍රීමත් චිත්තප්පලම් ගාර්ඩිනර් මාවත
කොළඹ 02

**<u>පොදු අධිකාරිය</u>**

**ඉදිරිපිටදී :**

1. විශ්‍රාමික විනිසුරු උපාලි අබේරත්න - සභාපති
2. විශ්‍රාමික විනිසුරු රෝහිණි වල්ගම - කොමසාරිස්
3. නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන - කොමසාරිස්
4. ජොෂ්ඨ නීතිඥ ජගත් ලියන ආරච්චි - කොමසාරිස්

**පෙනී සිටීම :**

අභියාචක සිටී. සූම් තාක්ෂණය ඔස්සේ පෙනී සිටී.

පොදු අධිකාරිය වෙනුවෙන් ජේ. වයි රණසිංහ මහතා, කළමණාකරන සේවා නිලධාරි පෙනී සිටී. එසේ වුවත් කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටීමට බලය පැවරීමේ ලිපියක් නොමැත.

**ලිඛිත සැළකිරීම් :**

අභියාචක - 2022.02.18
පොදු අධිකාරිය - 2022.02.10

**විභාග කළ දිනය :** 2022.01.18, 2022.02.24

**තීරණය කළ දිනය :** 2022.02.24

**<u>තීරණය</u>**

**අභියාචනයට පසුබිම් වූ කරුණු**

අභියාචක 2021.05.10 දිනැති තොරතුරු ඉල්ලීම මගින් පහත තොරතුරු ඉල්ලා ඇත.

1. *ඔක්ලෝ (පුද්ගලික) සමාගම [Oklo (Pvt) Ltd] [ශ්‍රී ලංකාවේ සමාගම් ලියාපදිංචි අංකය: PV 76369] දේශීය අදායම් දෙපාර්තමේන්තුවේ බදුගෙවන්නා හඳුනාගැනීමේ අංකයක් සඳහා (Taxpayer Identification Number) ලියාපදිංචි වී ඇතිද?*

2. *ඉහත අංක 1ට, පිළිතුරු 'ඔව්' නම්, ඉහත නම් සඳහන් පුද්ගලික සමාගම දේශීය අදායම් දෙපාර්තමේන්තුවේ බදුගෙවන්නා හඳුනාගැනීමේ අංකයක් සඳහා ප්‍රථමයෙන් ලියාපදිංචි වූ දිනය කවදාද?*

3. *ඉහත නම් සඳහන් පුද්ගලික සමාගමේ දේශීය අදායම් දෙපාර්තමේන්තුවේ බදුගෙවන්නා හඳුනාගැනීමේ අංකය කුමක්ද?*

තොරතුරු නිලධාරියා පනත ප්‍රකාරව, නියමිත කාලය තුල පිළිතුරු සැපයීමට අපොහොසත් වූ බැවින් අභියාචක විසින් 2021.07.03 දිනැතිව නම් කළ නිලධාරියා වෙත අභියාචනයක් යොමු කර ඇත. නම් කළ නිලධාරියාද පනත ප්‍රකාරව, නියමිත කාලය තුල පිළිතුරු සැපයීමට අපොහොසත්ව ඇති බැවින් 2021.08.03 දිනැතිව අභියාචක විසින් කොමිෂන් සභාව වෙත අභියාචනයක් යොමු කර ඇත.

පොදු අධිකාරිය විසින් 2022.02.10 දිනැති ලිපිය මගින් කොමිෂන් සභාවේ සභාපති අමතමින් මෙසේ සඳහන් කර ඇත. "එම තොරතුරු ලද බව දන්වා 2021.07.28 වන දින RTI 02 නිකුත් කර ඇත (ඇමුණුම 2). 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනතේ 5(1) (අ) වගන්තිය අනුව අදාළ තොරතුරු ඉල්ලුම්කරුට ලබා දිය නොහැකි බව දන්වා RTI 05 ලිපිය 2021.07.28 වන දින නිකුත් කර ඇත (ඇමුණුම 3).

අභියාචක විසින් 2022.02.18 දිනැති ලිපියක් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර තමා විසින් ඉල්ලා සිටින තොරතුරු කිසිඳු අකාරයකින් පුද්ගලිකත්වය ආක්‍රමණය කිරීමක් සිදු නොකරන අතර ඉල්ලා ඇත්තේ අදාළ සමාගම දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ බදුගෙවන්නා හඳුනාගැනීමේ අංකයක් සඳහා ලියාපදිංචි වී තිබේද යන්න සහ ලියාපදිංචි දිනය බවයි.

**<u>සළකා බැලීම</u>**

මෙම අභියාචනය සළකා බලන ලද අවස්ථාවේදී පොදු අධිකාරිය වෙනුවෙන් පෙනී සිටින ,,,,, මහතාගෙන් මෙම තොරතුරු හෙළිදරවු කිරීම 5 (1) (අ) වගන්තිය යටතේ නිශ්ප්‍රභා කිරීමට නීතිමය හැකියාවක් ඇත්ද යන්න විමසන ලද අතර ඒ සම්බන්ධයෙන් කොමිෂන් සභාවට සෑහීමකට පත් විය හැකි අන්දමේ පිළිතුරක් ඔහුගෙන් නොලැබිණි. මෙම තොරතුරු ඉල්ලීමට අදාළ කිසිදු තොරතුරක් රහසිගත තොරතුරු නොවන බවට ඔහු පිළිගත්තේය. උදාහරණයක් ලෙසට ඉල්ලා ඇති බදු ගෙවන්නා හඳුනා ගැනීමේ අංකය, බදු ගෙවන්නාට යවන ලිපි බහාලන කවර වල සඳහන්වී තිබීම තුළින් එම අංකයෙහි රහසිගතභාවයක් පිළිඹිබු නොවේ.

මෙම කරුණු සළකා බලන විට පොදු අධිකාරියෙහි තොරතුරු නිලධාරී හා නම් කළ නිලධාරී විසින් එළඹ ඇති නිගමනයන් හා එකඟ වීමට කොමිෂන් සභාවට හැකියාවක් නොමැත. එබැවින් නම් කළ නිලධාරී විසින් එළඹ ඇති නිගමනය ප්‍රතික්ෂේප කිරීමට කොමිෂන් සභාව තීරණය කරයි. අභියාචක විසින් 2021.05.10 වන දින තොරතුරු නිලධාරී වෙත ඉදිරිපත් කර ඇති තොරතුරු ඉල්ලීමෙහි සඳහන් අයිතම 01, 02, 03 යටතේ ඉල්ලා ඇති සියලුම තොරතුරු අභියාචක වෙත මුදා හැරීමට පොදු අධිකාරිය සහ තොරතුරු නිලධාරී ක්‍රියා කළ යුතු බවට කොමිෂන් සභාව තීරණය කරයි. ඒ අනුව මෙම කොමිෂන් සභාවට පිටපතක් සහිතව අභියාචක විසින් ඉල්ලා ඇති ඉහත සඳහන් තොරතුරු

2022.03.24 දින හෝ ඊට ප්‍රථම අභියාචක වෙත මුදා හැරිය යුතු බවටද කොමිෂන් සභාව වැඩිදුරටත් තීරණය කරයි.

එසේ ක්‍රියා කිරීමට පොදු අධිකාරිය අසමත් වන්නේ නම් පනතේ 39 වන වගන්තිය යටතේ පොදු අධිකාරියට සහ තොරතුරු නිලධාරීන්ට එරෙහිව මහේස්ත්‍රාත් අධිකාරණයේ නඩු පැවරිය යුතු බවට කොමිෂන් සභාව තීරණය කරයි.

කොමිෂන් සභාවේ මෙම තීරණය පොදු අධිකාරිය, තොරතුරු නිලධාරි සහ අභියාචක වෙත දැනුම් දීමට මෙම කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජෙනරාල්වරයා මෙහෙයවනු ලැබේ.

අභියාචනය අවසන් කරන ලදී.